ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2269/11 - 2022 පෙබරවාරි මස 28 වැනි සඳුදා - 2022.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 9/2016 (II)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2022 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

01. මේ නියෝග 2022 ඖෂධ (මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්වල මිල නියම කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මාත්‍රා ආකාරය පෙත්තක් හෝ කරලක් වන මිලිග්‍රෑම් පන්සියයක (මි.ග්‍රෑ. 500) ප්‍රබලතාව සහිත ඖෂධීය නාමය පැරසිටමෝල් මි. ග්‍රෑ. 500 පෙති/කරල් සඳහා වන උපරිම සිල්ලර මිල රුපියල් දෙකයි ශත තිහක් (රු. 2.30) විය යුතුය.

03. මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් සඳහා වන උපරිම සිල්ලර මිල මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්වල ඖෂධීය නාමයේ සියලු වෙළඳ නාමයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

04. විකිණීමේ කාර්යය සඳහා මි. ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් සන්තකයේ තබාගෙන සිටින යම් නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු, පශු වෛද්‍යවරයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින් ඒ මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්,


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද උපරිම සිල්ලර මිලට හෝ 6 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශෝධිත සිල්ලර මිලට වඩා වැඩි මිලකට විකුණනු නොලැබිය යුතු ය.

5. මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් විකුණනු ලබන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන 4 වන නියෝගයේ සඳහන් සෑම තැනැත්තකු හෝ ආයතනයක් විසින්ම එම විකිණීම සිදු කිරීමේ දී මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්වල අදාළ වෙළඳ නාමය සහ එහි මිල පැහැදිලිව දක්වමින් ලදුපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

6. (1) මේ නියෝග පළ කරනු ලබන දිනයේ දී 2 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද උපරිම සිල්ලර මිලට වඩා අඩු මිලක් වන යම් ප්‍රතිශෝධිත සිල්ලර මිලකට 2021 අගෝස්තු මස 19 වැනි දින අංක 2241/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2019 මැයි මස 15 වැනි දින අංක 2123/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2019 ඖෂධ (මිල ඉහළ සීමා) නියෝග යටතේ මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් විකුණනු ලබන යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් ඒ ප්‍රතිශෝධිත සිල්ලර මිල සියයට තිස්පහක ප්‍රතිශතයකින් (35%) සමානුපාතිකව වැඩි කරනු ලැබිය හැකිය.

එසේ වුව ද, මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් සඳහා වන ප්‍රතිශෝධිත සිල්ලර මිල පිළිබඳ එම වැඩි කිරීම 2 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද උපරිම සිල්ලර මිල නොඉක්මවනු ලැබිය යුතු ය.

(2) විකිණීමේ කාර්යය සඳහා මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් සන්තකයේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු, පශු වෛද්‍යවරයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ තැනැත්තකු විසින් මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්වල මිල, උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිලෙහි පවත්වාගෙන යා යුතු ය.

7. යම් පැරසිටමෝල් මාත්‍රා ආකාරයක් හෝ ප්‍රබලතාවයක් සහ ඒ පැරසිටමෝල් මාත්‍රා ආකාරයේ හෝ ප්‍රබලතාවයේ උපරිම සිල්ලර මිල 2 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඒ මාත්‍රා ආකාරයේ හෝ ප්‍රබලතාවයේ පැරසිටමෝල් සඳහා වන මිල නියම කරනු ලැබිය යුතු ය.

8. යම් නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් 2 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල නිෂ්පාදිත හෝ වෙළඳපොලේ පවතින තොගයේ මි. ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතුය.

එසේ වුව ද, මේ නියෝග පළ කරනු ලබන දින සිට දින හතළිස් පහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් වෙළඳ ඇසුරුම හෝ ලේබලය මත මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතුය.

9. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩු පවරනු ලැබිය යුතු ය.

10. මි. ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල්වල උපරිම සිල්ලර මිල හෝ ප්‍රතිශෝධිත සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම, විකිණීමේ කාර්යය සඳහා මි.ග්‍රෑ. 500 පැරසිටමෝල් පෙති/කරල් සන්තකයේ තබාගෙන සිටින සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු, බෙදාහරින්නකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු, පශු වෛද්‍යවරයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු වෛද්‍ය ආයතනයක, ඔසුසලක හෝ තැනැත්තකුගේ ම වගකීම විය යුතුය.

11. 2021 අගෝස්තු මස 19 වැනි දින අංක 2241/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2019 මැයි මස 15 වැනි දින අංක 2123/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2019 ඖෂධ (මිල ඉහළ සීමා) නියෝගවල උපලේඛනයේ 32 වන අයිතමය ඉවත් කිරීමෙන් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. මේ නියෝගවල –

"දන්ත වෛද්‍යවරයා" යන්නට (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ දී ඇති අර්ථය ම තිබිය යුතුය;

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ දී ඇති අර්ථය ම තිබිය යුතුය;

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත මගින් ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතුය; සහ

"පශු වෛද්‍යවරයා" යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ පශු වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ.

EOG 02-0693

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.